# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2140/50 - 2019 සැප්තැම්බර් මස 11 වැනි බදාදා - 2019.09.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : - IR/Com/01/2018/16

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2018.06.29 දිනැති හා අංක 2077/41 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2018.06.25 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් රත්මලාන, ගාලු පාර, නො. 181 හි පදිංචි බර්නාඩ් සුනිල් කාරියවසම් මයා සහ මහරගම, නාවින්න, පරණ කොට්ටාව පාර, නො. 94 හි පිහිටි ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.06.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අගෝස්තු මස 19 දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : - IR/Com/01/2018/16

කාර්මික අධිකරණයේ දී ය.

බර්නාඩ් සුනිල් කාරියවසම් මයා,
නො. 181, ගාලු පාර, රත්මලාන.

ඉල්ලුම්කරු

සහ

ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාව,
නො. 94, පරණ කොට්ටාව පාර,
නාවින්න, මහරගම

නඩු අංකය : ඒ/36/2018

**ප්‍රදානය**

කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් පනතේ (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) දරන පනත් වලින් සංශෝධනය වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 සංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාර ව උක්ත ආරාවුල නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2018.06.25 දින මා පත්කොට එකී ආරාවුල මා වෙත යොමුකර ඇත.

**ආරවුලට හේතු වී ඇති කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස්වරයා විසින් 2018 ජුනි මස 22 දින සහ ඇති ලිපියේ දැක්වෙන්නේ :-

''ශ්‍රී ලංකාවේ ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සේවය නියතු බර්නාඩ් සුනිල් කාරියවසම් යන අයට 2016.11.03 දින සිට වැඩ තහනමට ලක් කර එම වැඩ තහනම් කල කාලය තුළ කිසිම වැටුපක් නොගෙවීම සාධාරණ සහ යුක්ති සහගත වන්නේ ද? එසේ නොවන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ'' යනුවෙනි.

පෙනී සිටීම සහ බේරුම්කරණ විභාග පටිපාටිය :

මෙම පරීක්ෂණය 2018.09.14, 2018.10.23 සහ 2018.12.20 දින වල කැඳවන ලදී. මුල් වරට විභාගයට ගත් අවස්ථාවේදී ඉල්ලුම්කරු සහ ඔහුගේ නීතිඥ මහතා පෙනී සිටි අතර වගඋත්තරකාර පාර්ශ්වය


1A– G 30976 — 31 (2019/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වෙනුවෙන් ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාවේ සහකාර සාමාන්‍යාධිකාරි ශ්‍රියන්ත තිසේරා මහතා පෙනී සිටින ලදී. 2018.10.23 වන දින ඉල්ලුම්කාර පාර්ශ්වයේ නීතිඥ මහතා අසනීප තත්වයෙන් සිටින බව ඉල්ලුම්කාර පාර්ශ්වය සඳහන් කළ අතර ඒ අනුව මෙම නඩුව මෙදින විභාගයට නොගන්නා ලදී. එදින ද වගඋත්තරකාර පාර්ශ්වයේ පැමිණීම පෙර පරිදිම වේ. 2018.12.20 දින නැවත විභාගයට නියම කරන ලද අතර ඉල්ලුම්කරු සහ එම පාර්ශ්වයේ නීතිඥ මහතා පෙනී සිටින ලදී. වගඋත්තරකාර පාර්ශ්වයේ පෙනී සිටීම පෙර පරිදිම විය.

**පසුබිම**

මෙම බේරුම්කරණයට යොමු කර ඇති කාර්මික ආරවුල වශයෙන් ඉල්ලුම්කාර පාර්ශ්වය ප්‍රකාශ කර සිටින්නේ ඉල්ලුම්කරු ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ අලෙවි කළමනාකරු වශයෙන් සේවය කරමින් සිටියදී වගඋත්තරකරු විසින් 2016.11.03 දින වැඩ තහනමකට ලක් කළ බවත් ඉන් පසු ඊට අදාළව නිකුත් කරන ලද චෝදනා පත්‍රයක් මත 2018.05.09 දින සේවයෙන් පහ කරන ලද බවත් ය. කෙසේ වුව ද 2016.11.03 දින සිට 2018.05.09 දින සේවයෙන් පහ කළ දිනය දක්වා වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරුට අඩ වැටුප් හෝ කිසිදු වැටුපක් නොගෙවන ලද බවත් ප්‍රකාශ කර සිටී.

වගඋත්තරකාර පාර්ශ්වය සිය පළමු ප්‍රකාශය මගින් හෙළිදරව් කර ඇත්තේ ඉල්ලුම්කරු 1998.10.01 දින සිට වගඋත්තරකාර ආයතනයේ සේවයට බැඳී ඇති බවත්, 2016.11.03 දින දක්වා අලෙවි කළමනාකරු ලෙස සේවය කළ බවත් ය. එසේ සේවය කිරීමේ දී ඉල්ලුම්කරු අලෙවි කළමනාකරු ලෙස වෙළඳ පොළ තත්ත්වය සහ අලෙවි ප්‍රවර්ධනය ගැන සොයා නොබලා අවශ්‍ය ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයක් වයින් බෝතල් සහ කිරල මූඩි මිල දී ගැනීමේ අක්‍රමිකතාවයක් මත ආයතනයේ රු. 1284525.04 ක මුදලක් අවභාවිතා කිරීම හේතුවෙන් ඉල්ලුම්කරුගේ සේවය අත්හිටුවා ඉන්පසු විධිමත් විනය පරීක්ෂණ වාර 22 ක් පැවැත්වීමෙන් අනතුරුව ඉල්ලුම්කරුට ඇති චෝදනා සියල්ලටම වැරදිකරු වූ බැවින් 2018.05.04 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත 2018.05.09 දින සේවයෙන් පහ කළ බවත්, වැඩ තහනම් කළ කාලයට වැටුප් ගෙවීමක් සිදු නොකළ බවයි. ඉල්ලුම්කරුගේ 2018.07.24 දිනැති ප්‍රකාශයෙහි සඳහන් වන්නේ තමන්ට කර ඇති චෝදනා අතර ප්‍රධාන චෝදනාව වන්නේ 2011 වසරේ හිස් වයින් බෝතල් 25000 ක් සහ කිරල මූඩි 30000 ක් ඉල්ලුම් කිරීමයි. එසේ ඉල්ලීමට පදනම් වූයේ ඊට පෙර වයින් බෝතල් 10000 ක් සහ කිරල මූඩි 12000 ක අවශ්‍යතාවය ඉල්ලුම් කලත්, එවැනි ප්‍රමාණයක් සැපයීමට ආයතන ඉදිරිපත් නොවන බැවින් සැපයුම් අංශයේ දැනුම් දීම මත පැවති තත්ත්වය සහ ප්‍රවර්ධනය පදනම් කර ගෙන වයින් බෝතල් 25000 ක් හා කිරල මූඩි 30000 ක් ගෙන් වූ බවත් ය. (සැපයුම් අංශයෙන් කළ එකී දැනුම් දීම ලිඛිතව නොමැත.) කෙසේ වුව ද ඉල්ලුම්කරු දිගින් දිගටම තම ප්‍රකාශයෙන් කියා සිටින්නේ සංස්ථාවේ සභාපතිවරයා තමා සමග ද්වේශයෙන් කටයුතු කළ බැවින් ඉහත කී චෝදනාව එල්ල වූ බවයි.

මෙම ආරවුල 2018.09.14, 2018.12.20 දින විභාගයට ගැණුන අතර දෙපාර්ශ්වය අතර සමථයක් නොවුන හෙයින් පැමිණිලි පාර්ශ්වයේ සාක්ෂි මෙහෙය වීම ආරම්භ කරන ලදී. එකී පැමිණිල්ල විභාගයට ගත් අවස්ථාවේ දී පැමිණිලි පාර්ශ්වය දිගින් දිගටම කියා සිටින්නේ තමාට සේවය අත්හිටවූ දින සිට සේවය අවසන් කළ දිනය දක්වා හිඟ වැටුප් නොගෙවීම සම්බන්ධයෙන් තමන් විසින් ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාවේ ඉහළ කළමනාකාරිත්වයට අභියාචනා කළ බවත්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වෙත සහ කම්කරු විනිශ්චය සභාව වෙත ද සහනයක් පතා ඉල්ලුම් කර ඇති බවත් ය. එසේ ඉල්ලුම් කළ බව සනාථ කිරීමට එකී ඉල්ලීම් පිළිබඳව ලේඛන ලකුණු කර ඇති අතර එම ඉල්ලීම් සම්බන්ධයෙන් කිසිදු සහනයක් නොලද බව ද කියා සිටී. දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කළ ප්‍රකාශයන් හැරුණු විට මීළඟ අවධානය යොමු කළ යුතු වන්නේ නඩු විභාගයේ දී ඉදිරිපත් වූ කරුණු සම්බන්ධයෙනි. මෙහි දී ඉල්ලුම්කාර පාර්ශ්වය නඩුවේ සාක්ෂි ලබා දී ඇති අතර එකී සාක්ෂි වගඋත්තරකාර පාර්ශ්වය විසින් හරස් ප්‍රශ්න සඳහා භාජනය කිරීමක් සිදු කර නොමැත. එයින් පෙනී යන්නේ එකී සාක්ෂි පිළිබඳ හබ කිරීමක් නොමැති බවයි.

කෙසේ වුව ද ඉල්ලුම්කාර පාර්ශ්වය 2018.09.14 සහ 2018.12.20 දිනයන් හි සිය සාක්ෂියේ දී ප්‍රකාශ කර ඇත්තේ 2016.11.03 තම සේවය අත්හිටවූ දින සිට 2018.05.09 දින තමා සේවයෙන් පහ කළ දිනය දක්වා තමාට නොගෙවා ඇති වැටුප් ලබා ගැනීම පිණිස තමන් විසින් විවිධ ආයතන වලට අභියාචනා ඉදිරිපත් කළ නමුත් මෙතෙක් සහනයක් නොලැබුණු බවයි.

සාක්ෂියේ දී ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති ඒ - 1 ලේඛනය ''ඉල්ලුම්කරුගේ සේවය අත්හිටුවීම සහ ''සේවා පරිශ්‍රයට ඇතුළත් වීම වැලැක්වීම සම්බන්ධයෙන්'' 2016.11.03 දිනැතිව සභාපති සහ විනය බලධාරී, ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාව විසින් යවා ඇත. සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ හදිසි වැටලීම් ඒකකය මගින් සිදු කරන ලද මූලික විමර්ශන වාර්තා සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා මෙන්ම රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 35 වගන්තිය යටතේ එසේ ක්‍රියා කළ බව එකී ලේඛනය මගින් ඉල්ලුම්කරුට දන්වා ඇත.

කෙසේ වුව ද ඉල්ලුම්කරු සිය සාක්ෂියේ දී ප්‍රකාශ කර ඇත්තේ ඒ - 1 ලේඛනයේ සඳහන් මූලික විමර්ශනය, අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ආදිය සම්බන්ධයෙන් තමාගේ වැඩ තහනම් කරන අවස්ථාව වන විටත් තමා දැනුවත් කර නොතිබූ බවයි. ඒ අනුව තමා විසින් නැවත සේවය ලබා දෙන ලෙසත් වැටුප් ලබා දෙන ලෙසත් අභියාචනා කළ බව ඉල්ලුම්කරු සාක්ෂියේ දී ප්‍රකාශ කර ඇත.

ඉල්ලුම්කරු ඒ - 2 ලේඛනය ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටින්නේ තමන් 2017.01.21 දින සභාපති ආයුර්වේද සංස්ථාව වෙත යැවූ ලිපියට පිළිතුරු වශයෙන් ඒ - 2 ලේඛනය තමා වෙත එවා ඇති බවත් එමගින් ආයුර්වේද සංස්ථාවේ සභාපතිවරයා විසින් තමාට අඩ වැටුප් නොගෙවීමට තීරණය කර ඇති බවයි. මේ හැර ඒ - 3 ලේඛනය මගින් ඉල්ලුම්කරු නැවත අඩ වැටුප් ඉල්ලා ඇති බව එකී ලේඛනය ඉදිරිපත් කරමින් කියා සිටී. තවද එකී ලේඛනය ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇත්තේ ඔහු ඊට පෙර මානව හිමිකම් කොමිසමට මේ පිළිබඳව අභියාචනා කළ විට එකී කොමිසමේ ඉල්ලීම මත නැවත අඩ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ඉල්ලීමක් කරන ලෙස ''වගඋත්තරකාර සංස්ථාවේ සභාපතිවරයා සහ කළමනාකාර අධ්‍යක්ෂවරයා'' තමාට දැනුම් දීම මත බව ඉල්ලුම්කරු ප්‍රකාශ කර සිටී. එකී ලිපියට පිළිතුරු දෙමින් සභාපතිවරයා ඉල්ලුම්කරු වෙත දන්වා ඇත්තේ අඩ වැටුප් ගෙවීම පසුව සලකා බැලීමටත් විනය පරීක්ෂණය කඩිනමින් පැවැත්වීමට පරීක්ෂණ නිලධාරියාට දන්වා ඇති බවයි. එකී ලේඛනය ඒ - 4 ලෙස ඉල්ලුම්කරු විසින් ලකුණු කර ඇත. එයට පිළිතුරු වශයෙන් ඉල්ලුම්කරු තම ආර්ථික දුෂ්කරතා මෙන්ම බරපතල මූල්‍ය

ප්‍රතිපත්තීන්ට මුහුණ දී ඇති බව පවසමින් ඒ - 5 ලේඛනය මගින් නැවත අභියාචනා කර ඇති බව සිය සාක්ෂියේ දී වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. ඒ - 5 ලේඛනය මත කළ අභියාචනයට ද පිළිතුරක් හෝ යම් සහනයක් නොලද බැවින් ද, තමන්ගේ විනය පරීක්ෂණය ඒ වන විටත් අවසන්ව නොතිබූ බැවින් ද, 2017.09.11 දිනැති ලිපිය මගින් තමන් ලේකම් සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත නැවත අභියාචනා කළ බව ඉල්ලුම්කරු විසින් සිය සාක්ෂියේ දී ඒ - 6 ලේඛනය ලකුණු කරමින් ප්‍රකාශ කර සිටින ලදී. එයට ද තමන්ට යහපත් ප්‍රතිචාරයක් නොලද බවත් කෙසේ වුව ද, තමන් ට ද අඩ වැටුප් ගෙවීම පසුව සලකා බලන බවට ද, විධිමත් විනය පරීක්ෂණය කඩිනමින් අවසන් කිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාව විසින් තීරණය කර ඇති බවත් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉල්ලුම්කරුට දන්වා ඇති බව ඉල්ලුම්කරු විසින් ඒ - 7 ලේඛනය ලකුණු කරමින් සිය සාක්ෂියේ දී ප්‍රකාශ කර සිටින ලදී.

මේ හැර ඒ - 8 ලේඛනය ලකුණු කරමින් ඉල්ලුම්කරු ප්‍රකාශ කර සිටින්නේ ''මාස 06 ක් තුළ විධිමත් විනය පරීක්ෂණය අවසන් නොවන්නේ නම් එම නිලධාරියාට ලබා දිය යුතු සහන ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස'' සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් වගඋත්තරකාර පාර්ශ්වයට දන්වා ඇති බවයි.

මේ හැර ඉල්ලුම්කරු විසින් ඉහත කී අභියාචනයන්ට අමතරව මානව හිමිකම් කොමිසම වෙත ද, කම්කරු විනිශ්චය සභාව වෙත ද අවසාන වශයෙන් කම්කරු කොමසාරිස්වරයා වෙත ද සහනයක් පතා තම ඉල්ලීම් යොමු කර ඇති අතර මෙතෙක් කිසිදු සහනයක් නොලද බව ද කියා සිටී. තව ද ඉල්ලුම්කරු සිය සාක්ෂියේ දී වැඩිදුරටත් ඒ - 13 නම් ලේඛනය ලකුණු කරමින් (එනම් SC Appeal No. 18/2009 නඩුවේ නියෝගය) කියා සිටින්නේ එකී නඩු තීරණයේ ප්‍රතිපාදන අනුව ද තමන්ගේ වැඩ තහනම් කළ 2016.11.03 දින සිට 2018.05.09 දින දක්වා කාලයට තමන්ට නොගෙවූ වැටුප ගෙවිය යුතු බවයි. තව ද එසේ ගෙවීම යුක්ති සහගත ද නැති ද යන්න කාර්මික අධිකරණය විසින් තීරණය කළ යුතු බවට ද කරුණු දක්වා ඇත.

ප්‍රදානය ඉදිරිපත් කිරීමේ ස්ථාවරය.

දෙපාර්ශ්වයේම ප්‍රකාශයන් හා ඉල්ලුම්කාර පාර්ශ්වයේ සාක්ෂි මත පහත ස්ථාවරයන්ට එළඹිය හැක.

01. යම් යම් හේතූන් මත වයින් බෝතල් සහ කිරල මූඩි අවශ්‍ය ප්‍රමාණය වඩා මිලට ගෙන ඇති බව දෙපාර්ශ්වයම පිළිගනී.

02. එමෙන්ම එකී වැඩිපුර මිල දී ගැනීම් වලින් කොටසක් ගබඩාවේ රැඳී ඇති බව දෙපාර්ශ්වයම පිළිගනී.

03. 2018.07.24 දිනැතිව ඉල්ලුම්කාර පාර්ශ්වයේ ප්‍රකාශය අනුව කියැවෙන්නේ 2016 වන විට මෙකී භාණ්ඩ තොගයෙන් 20% ක් ප්‍රයෝජනයට ගෙන ඇති බවත්, ඉතිරි කොටස ගබඩාවේ රැඳී පැවති බවයි. වගඋත්තරකාර පාර්ශ්වයේ ප්‍රකාශනය මත ද 2011 සිට 2016 දක්වා කාලය තුළ ඉහත පරිදි භාණ්ඩ වලින් කොටසක් ප්‍රයෝජනයට ගත් බව කියැවේ. මේ අනුව ගම්‍ය වන්නේ එකී භාණ්ඩ තොගයම නිශ්චිතවම රැඳී නොපවතින අතර වසරක් පාසා භාවිතයට ගන්නා බවයි. එකී භාණ්ඩ දිරාපත්ව ඇති බවට හෝ භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව ඇති බවට වගඋත්තරකාර පාර්ශ්වය විසින් සෑහීමකට පත්විය හැකි තොරතුරක් මෙම නඩු විභාගයේ දී ඉදිරිපත් කර නැත.

04. ඉල්ලුම්කාර පාර්ශ්වය 2018.07.24 දිනැති ප්‍රකාශය මගින් වැඩිදුරටත් කරුණු දක්වන්නේ මිල දී ගත් වයින් බෝතල් සහ කිරල මූඩි ප්‍රමාණය ගබඩාවේ රැඳී පැවතීමට හේතු වන්නේ නිෂ්පාදන අංශයෙන් සැලකිය යුතු නිෂ්පාදනයක් (එනම් ඉල්ලුමට සරිලන නිෂ්පාදනයක්) නොවූ නිසා බවටයි. මේ පිළිබඳව වගඋත්තරකාර පාර්ශ්වය මෙම නඩු විභාගයේ දී සාක්ෂි ලබා දීමෙන් හරස් ප්‍රශ්න විමසීමෙන් හෝ උත්තර ප්‍රකාශ මගින් හබ කිරීමක් සිදු කර නොමැත.

05. මේ හැර වගඋත්තරකරුගේ පළමු ප්‍රකාශය සමග ඉල්ලුම්කරුට අදාළව පැවැත්වූ විනය පරීක්ෂණයේ සටහන් ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇත. එකී ඇමුණුමෙහි සාක්ෂිකරුවෙකුගේ සාක්ෂිය තුළින් කියැවෙන්නේ ''අලෙවි කළමනාකරු සතුව නව මුහුණුවරකින් වයින් බෝතල් වෙළඳ පොළට හඳුන්වා දීමේ සැලැස්මක් තිබූ බවත් විවිධ හේතූන් මත එකී සැලැස්ම ක්‍රියාත්මක නොවූ බවත් ය. ''මෙයින් පෙනී යන්නේ ඉල්ලුම්කරු සතුව වෙළඳ පලට වැඩිපුර නිෂ්පාදන යැවීමේ අරමුණක් ඇතිව තිබූ බවයි. කෙසේ වුව ද එකී සාක්ෂිකරුගේ ප්‍රකාශයෙන්ම වැඩිදුරටත් ප්‍රකාශ වන්නේ විවිධ හේතු මත එය ක්‍රියාත්මක නොවූ බවයි. ඉහත කී කරුණු අනුව මෙහි දී ඉල්ලුම්කරු වෙළඳ පොළ කෙරේ අවධානයෙන් සිටි බව පැහැදිලි වේ. වෙළඳ පොළ සංවර්ධනය කිරීමේ යම් අරමුණක සිට ඉල්ලුම්කරු ක්‍රියා කර ඇති බව ද පෙනේ. ඒ අනුව ගබඩාවේ වූ බෝතල් සහ කිරල මූඩි අතිරික්තය ඉල්ලුම්කරුගේ නොසැලකිල්ල හෝ අවධානයක් නොමැතිකම නිසාම සිදු වූ බව තහවුරු නොවේ.

06. මේ හැර ඉල්ලුම්කරුගේ සේවය අත්හිටවූ මාස 17 ක කාලය තුළ වැටුප් නොලැබීමෙන් දැඩි ලෙස පීඩනයට පත්ව සිටි බැවින් වරින් වර වැටුප් හෝ අඩ වැටුප් ඉල්ලා ඉල්ලුම්කරු විසින් පහත ආයතන වෙත අභියාචනා ඉදිරිපත් කර ඇති බව ඉල්ලුම්කරුගේ වාචික සාක්ෂි මෙන්ම ඔහුගේ සාක්ෂියේ දී ඉදිරිපත් කර ඇති ලේඛන මත පැහැදිලි වේ. එනම් ඉල්ලුම්කරු විසින් වගඋත්තරකාර සමාගම සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යන තම ඉහළ බලධාරීන්ට මෙන්ම, මානව හිමිකම් කොමිසම, කම්කරු විනිශ්චය සභාව, කම්කරු දෙපාර්තමේන්තුව යන ආයතනයක් වෙත තම සේවය අත්හිටවූ කාලය සම්බන්ධයෙන් අඩ වැටුප් ඉල්ලා අභියාචනා කර ඇති බව ඉල්ලුම්කරුගේ සාක්ෂි ය තුළින් හෙළිදරව් වේ.

ඉල්ලුම්කරු සිය සාක්ෂියෙන් සළකුණු කර ඇති ඒ - 2 ලේඛනය අනුව ඔහු මුලින්ම අඩ වැටුප් ඉල්ලා ඇත්තේ 2017.01.21 දින දී ය. එයින් මාස 03 ක් ඉකුත් වූ පසු විනය බලධාරී විසින් එකී ලිපියට පිළිතුර ලබා දෙමින් විනය පරීක්ෂණය අවසාන වන තෙක් අඩ වැටුප් නොගෙවන බව දක්වා ඇත.

ඉන් පසු සිය සාක්ෂියේ දී ඉදිරිපත් කර සලකුණු කර ඇති ඒ - 5 ලේඛනය මගින් (2017.06.14 දිනැති ලිපිය) මගින් ඉල්ලුම්කරු තමාට වැටුප් නොලැබීම මත පත්ව ඇති ආර්ථික සහ මූල්‍යමය අර්බුදය වගඋත්තරකරු වෙත දන්වා ඇත.

නැවත ඉල්ලුම්කරු විසින් 2017.11.14 දිනැති ලිපිය වගඋත්තරකරු වෙත යවමින් ප්‍රකාශ කර ඇත්තේ තමා මානව

හිමිකම් කොමිසමට කළ පැමිණිල්ලේ විමර්ශනයේ දී අඩ වැටුප් ගෙවන ලෙස වගඋත්තරකාර සමාගමේ අධ්‍යක්ෂවරයාට සහ සභාපතිවරයාට දන්වා ඇති හෙයින් ඒ පිළිබඳව සලකා බලා අඩ වැටුප් ගෙවීමට ක්‍රියා කරන ලෙසත් ඒ පිළිබඳව කිසියම් පිළිතුරක් ලබා දෙන ලෙසත් ය. සාක්ෂිකරු විසින් සිය සාක්ෂියේ දී ඒ - 3 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

එකී ඉල්ලීමට පිළිතුරු ලෙස වගඋත්තරකාර පාර්ශ්වය ඉල්ලුම්කරුට 2017.12.07 දිනැතිව පිළිතුරු යවමින් දන්වා ඇත්තේ විනය පරීක්ෂණය කඩනමින් අවසන් කිරීමට පරීක්ෂණ නිලධාරි වෙත දන්වා යැවීමට තීරණය කර ඇති බවයි. එකී ලේඛනය ඉල්ලුම්කරුගේ සාක්ෂියේ දී ඒ - 4 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. මේ අනුව පෙනී යන්නේ ඉල්ලුම්කරුගේ ඉල්ලීම මත මිස විනය පරීක්ෂණය කඩනමින් සිදු කිරීමට විනය බලධාරියා විසින් ස්වේච්ඡාවෙන් පියවර ගෙන නොමැති බවයි.

මේ හැර 2017.09.11 දිනැතිව ඉල්ලුම්කරු විසින් සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා වෙත යවා ඇති ලිපියට ලැබූ පිළිතුරු ඉල්ලුම්කරු සිය සාක්ෂියේ දී ඒ - 7 වශයෙන් සළකුණු කර සාක්ෂි ලබා දී ඇති අතර එයින් ද කියැවෙන්නේ ඉල්ලුම්කරු සම්බන්ධයෙන් වූ විනය පරීක්ෂණය කඩිනමින් අවසන් කිරීමට අඩ වැටුප් ගෙවීමට පසුව සලකා බැලීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇති බව වගඋත්තරකාර සමාගම විසින් තමා වෙත දන්වා ඇති බවයි.

ඉහත කී කරුණු අනුව පෙනී යන්නේ විනය පරීක්ෂණයේ ප්‍රමාදය මත ඉල්ලුම්කරුට දිගින් දිගටම අභියාචනා කිරීමට සිදු වූ බවයි. එමෙන්ම ඉල්ලුම්කරු විසින් සිය සාක්ෂියේ දී සලකුණු කර ඉදිරිපත් කර ඇති ඉහතින් ද විස්තර කළ ඒ - 2, ඒ - 4, ඒ - 7 ලේඛන වල තොරතුරු මත ද විනය පරීක්ෂණය ප්‍රමාදය වූ බව මනාව පැහැදිලි වේ.

ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 22:1 වගන්තිය අනුව විනය පරීක්ෂණයක් ප්‍රමාද වන්නේ නම් ඒ ඒ අවස්ථාවේ නිසි පියවර ගැනීම විනය බලධාරියාගේ කාර්ය වේ. එහෙත් ඉහත කී කරුණු අනුව පෙනී යන්නේ විනය පරීක්ෂණය කඩිනම් කිරීමටත් විනය බලධාරියා විසින් පියවර ගෙන ඇත්තේ මෙම නඩුවේ ඉල්ලුම්කරුගේ ඉල්ලීම් ගණනාවක ප්‍රතිඵලයක් වශයෙනි. මේ අනුව එකී ප්‍රමාදය හේතුවෙන් ද ඉල්ලුම්කරුට දැඩි අසාධාරණයක් සිදුව ඇති බව පෙනේ. විනය පරීක්ෂණය ප්‍රමාද වීමෙන් වැටුප් අත්හිටවූ කාලය තවදුරටත් වැඩි වීමත් වැටුප් පිළිබඳ තීරණය විනය පරීක්ෂණය අවසානයේ සිදු කරන බව ප්‍රකාශ කිරීමෙන් ඉල්ලුම්කරුට තවදුරටත් වැටුප් පිළිබඳ බලාපොරොත්තු තබා ගත හැකි තත්වයක් වගඋත්තරකරු විසින්ම නිර්මාණය කර දී ඇති බව ද පෙනේ. එමෙන්ම ඉහත හේතූන් මත ඉල්ලුම්කරු දැඩි ආර්ථික මෙන්ම මානසික පීඩනයකට ද පත්ව ඇත. ''වැටුප යනු සේවක ගිවිසුම මත පැන නැගෙන ස්වභාවික අයිතියකි. ඒ අනුව සේවයට පැමිණීමට තහනම් කළ කාලය තුළ වුව ද සේවකයෙකුට වැටුප් ගෙවීමට සේවායෝජක බැඳී පවතින බව ඉහළ අධිකරණයේ නඩු තීරණයක් වන SC Appeal No/ 18/2009 තීරණයෙන් ද පැහැදිලිව දක්වා ඇත. එහි තවදුරටත් සඳහන් වන්නේ සේවකයා සේවයෙන් පහ කළ අවස්ථාවක වුව ද ඔහුට සේවය තහනම් කළ කාලයට අදාළ වැටුප් ගෙවිය යුතු බවයි. කෙසේ වුව ද ඉහත කී කරුණු අනුව සලකා බැලීමේ දී ඉල්ලුම්කරු විසින් අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි බෝතල් හා කිරල මූඩි සැපයීමක් සිදු කර ඇති අතර එය ගබඩාවේ රැඳී පැවතීමෙන් යම් අලාභයක් සිදු වීමට ඉඩ ඇත. එමෙන්ම ඉහත සඳහන් වගඋත්තරකරුගේ පළමු ප්‍රකාශයේ සඳහන් කරුණු අනුව ද ඉල්ලුම්කරු විසින් නිෂ්පාදනය වැඩි කිරීමේ යම් සැලැස්මක් තිබුණ ද එය විවිධ හේතූන් මත ක්‍රියාත්මක කර නොමැති බව ද හෙළිදරව් වී ඇත. මීට අමතරව නිෂ්පාදන අංශයෙහි සැපයුමෙහි අඩු වීමක් ද පැවති බව ඉදිරිපත් වූ කරුණු අනුව අනාවරණය වේ.

I. ඉහත කී කරුණු අනුව අවශ්‍ය ප්‍රමාණය වඩා වැඩි බෝතල් සහ කිරල මූඩි ප්‍රමාණයක් ගබඩාවේ රඳවා පැවතීම සම්බන්ධයෙන් ඉල්ලුම්කරු මෙන්ම වගඋත්තරකාර පාර්ශ්වය ද වගකීමට බැඳෙන බව නිගමනය කරමි.

II. එමෙන්ම ඉහත කී පරිදි විනය පරීක්ෂණයේ දී සිදු වූ කල් පමාව නිසා ඉල්ලුම්කරුට ද අසාධාරණයක් ඇති වූ බව නිගමනය කරමි. ආයතන සංග්‍රහයේ XLVIII වගන්තියට අනුව ''යුක්තිය පසිඳලීමට ප්‍රමාද කිරීම යුක්තිය ඉටු නොකිරීමකි'' මේ අනුව ඉල්ලුම්කරුගේ ඉල්ලීම වලට සාධාරණ කාලයක් තුළ සවන් නොදීමෙන් ඉල්ලුම්කරුට යම් අගතියක් ඇති බව නිගමනය කරමි.

III. කෙසේ වුව ද අවශ්‍ය ප්‍රමාණයට වඩා ගබඩාවේ රඳවා පැවතීමෙන් වගඋත්තරකාර ආයතනයට යම් අලාභයක් සිදු ව ඇත. කෙසේ වුව ද එකී අලාභය ගණනය කර ඇත්තේ 2016 වර්ෂය දක්වා ය. එසේ වුවද එකී භාණ්ඩ දිගින් දිගටම වගඋත්තරකාර ආයතනය විසින් ගබඩාවේ සුරක්ෂිතව තබා ගෙන භාවිතයට ගෙන ඇති බව වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර ඇති ප්‍රකාශය තුළින්ම පැහැදිලි වේ. ඒ අනුව අලාභය කොතෙක් ද යන්න නිශ්චිතව පැහැදිලි නොවේ.

කෙසේ වුව ද මෙකී පැමිණිල්ල මත දැනටමත් ඉල්ලුම්කරු සේවයෙන් පහ කර ඔහුට දඬුවම් ලබා දී ඇත. එසේ හෙයින් ඉහත කරුණු සියල්ල සලකා බලා මෙම නඩුවේ ප්‍රදානය පහත පරිදි ඉදිරිපත් කරමි.

ප්‍රදානය :

1. පැමිණිලිකරුට සිදු වූ ආර්ථික, මූල්‍යමය පාඩුව සහ වැටුප් නොලැබීමෙන් සිදු වූ අසාධාරණය සලකා බලා සේවය අත්හිටවූ මාස 17 ක කාලය වෙනුවෙන් ඔහුගේ වැටුපට අදාළව පන් ලක්ෂ හතලිස් හය දහස් අනූ එකක (රු. 546,091.00) ක මුදලක් ඉල්ලුම්කරුගේ සේවය අහිමි වූ කාලය වෙනුවෙන් අඩ වැටුපක් ලෙස ගෙවීමට වගඋත්තරකරුට නියම කරමි.
2. එකී මුදල මෙම නියෝගය ගැසට් වීමෙන් පසු මාස 02 ක් තුළ මහරගම දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කිරීමට වගඋත්තරකරුට වැඩිදුරටත් නියෝග කරමි.
3. තවද මෙකී ප්‍රදානය සාධාරණ යුක්ති සහගත වුත් ප්‍රදානයක් බව වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

එච්. එම්. අනුලාවතී
බේරුම්කරු.

2019.06.20

09 - 874

මගේ අංකය : - IR/Com/04/E//2015/169(A)

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2018.03.14 දිනැති හා අංක 2062/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.03.08 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කඩවත, මහර, එලිසබෙත් පෙරේරා මාවත, නො. 130/13/1 හි පදිංචි ඩබ්. එල්. පී. ඉමාලි මහේෂණී ඇතුළු සේවකයින් 13 දෙනා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 03, ගාලු පාර, නො. 80 හි පිහිටි ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.01.18 දිනැති ප්‍රදානය පළ කරනු ලැබූ 2019.04.18 දිනැති හා අංක 2119/14 දරන ගැසට් නිවේදනය සඳහා අමතර එක් කිරීමක් ලෙස 2019.08.09 දිනැති සංශෝධිත ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අගෝස්තු මස 26 දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

නාරාහේන්පිට කාර්මික අධිකරණයේ දී ය.

ඩබ්. එල්. පී. ඉමාලි මහේෂනි මිය
ඇතුළු සේවකයින් 13 දෙනා,
130/13/1, එළිසබෙත් පෙරේරා
මාවත,
මහර, කඩවත.

ඉල්ලුම්කරුවන්

සහ

බේරුම්කරණ අංක : ඒ/3635
නව අංකය : ඒ/12/2018
IR/Com/04/E//2015/169(A)

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන
අධිකාරිය,
අංක 80, ගාලු පාර,
කොළඹ 03.

වගඋත්තරකරු

**A/12/2018 නඩුවේ ප්‍රදානය සංශෝධනය කිරීම**

2019.04.18 දිනැති අංක 2119/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද A/12/2018 නඩුවට අදාළ ප්‍රදානයෙහි සඳහන් නම් පහට අමතරව බී. ඒ. සී. මාලින්ද යන අයගේ නම ද ඇතුළත් කොට පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බව දන්වා සිටිමි.

**ප්‍රදානය**

ඒ අනුව මෙම බේරුම්කරණ නඩුවේ ප්‍රදානය පහත අයවලුන් හට පමණක් වලංගු වන පරිදි ප්‍රකාශ කරමි. එනම්,

01. ඩබ්ලිව්. එල්. පී. ඉමාලි මහේෂනී
02. එච්. ලක්ෂානි වීරතුංග
03. වී. කේ. ඩී. බණ්ඩාර
04. ටී. එන්. විතාරණ
05. එන්. ඒ. ශ්‍රියාසිංහ
06. බී. ඒ. සී. මාලින්ද යන අයයි.

එස්. කාරියවසම්,
බේරුම්කරු

2019 අගෝස්තු මස 09 වැනි දින.

09 - 875

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.